(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 13.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2018 දෙසැම්බර් 21 වැනි සිකුරාදා පූ.භා. 10.30 ට**

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී 27 සහ 121(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— 8 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල කුමක් සඳහන් වුවද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2019 ජනවාරි 08 වැනි අඟහරුවාදා අ.භා. 1.00 වනතෙක් කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනා සම්මතය,— 2019 ජනවාරි 1 දිනයෙන් ආරම්භ වී 2019 මුදල් වර්ෂයේ සේවාවන් සඳහා ප්‍රතිපාදන සැලසෙන විසර්ජන පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනය හෝ 2019 අප්‍රේල් 30 වන දිනය යන දින දෙක අතුරින් පළමුව එළඹෙන දිනයෙන් අවසාන වන කාලසීමාව තුළදී -

(අ) (2017 අංක 30 දරන විසර්ජන පනතින් හා පරිපූරක ඇස්තමේන්තු මඟින් වියදම් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබූ සේවාවන් වන) මෙම යෝජනා සම්මතයට අදාළ සභාගත කරන ලද පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සේවාවන් සඳහා රුපියල් හත්සිය අනූ බිලියන එකසිය හැට මිලියන හයසිය තිස් හතර දහස (රු. 790,160,634,000)ක මුදලකට නොවැඩි මුදලක්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු බව සහ එකී මුදල, ඉහත කී කාල සීමාව තුළ දී, එම උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ආකාරයට වැය කරනු ලැබිය හැකි බවත්;

(ආ) මෙම යෝජනා සම්මතයට අදාළ සභාගත කරන ලද දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සේවාවන් සඳහා (යම් සේවාවක් සැපයීමට අදාළ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බවට නීති මඟින් බලය දී ඇත්තේ ද, ඒ වියදම්) රුපියල් නවසිය හැත්තෑ බිලියන තුන්සිය හැට තුන් මිලියන එකසිය අනූ දෙදහස (රු. 970,363,192,000)ක මුදලකට නොවැඩි මුදලක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු බව සහ එකී මුදල, ඉහත කී කාල සීමාව තුළ දී, එම උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට වැය කරනු ලැබිය හැකි බවත්;

(ඇ) මෙම යෝජනා සම්මතයට අදාළ සභාගත කරන ලද තෙවන උපලේඛනයෙහි I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති සේවාවන් සඳහා මුළු එකතුව රුපියල් බිලියන පහ (රු.5,000,000,000)ක මුදලකට නොවැඩි මුදලක්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් දෙනු ලබන අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු බව සහ ඉහත කී කාලසීමාව තුළදී එවැනි යම් සේවාවන් වෙනුවෙන් දරනු ලබන වියදම්, එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති උපරිම සීමා නොඉක්මවිය යුතු බවත්; සහ

(ඈ) රුපියල් බිලියන නවසිය අනූව (රු.990,000,000,000)ක මුදලකට නොවැඩි මුදලක්, මෙම යෝජනා සම්මතයෙහි සඳහන් එකී සේවාවන් සැපයීම සඳහා වන වියදම් සඳහා ප්‍රතිපාදන සැපයීමට අදාළව ආණ්ඩුව සඳහා හෝ ආණ්ඩුව වෙනුවෙන්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර අදාළ නීති ප්‍රකාරව ණය වශයෙන් ලබාගන්නා මුදල් විය යුතු බව සහ එකී ණය මුදල්වල විස්තර, 2003 අංක 3 දරන මූල්‍ය කළමණාකරන (වගකීම) පනතේ 13 වගන්තිය යටතේ පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු වන අවසාන අයවැයවල තත්ත්වය පිළිබඳ වාර්තාවට ඇතුළත් කළ යුතු බවත්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (2) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

2.

පා. 3/'18

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරි පියවර ගතයුතු බව,— 2018 ඔක්තෝබර් 26 වැනි දින ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්ද රාජපක්ෂ මහතා අග්‍රාමාත්‍යවරයා ලෙස පත්කළ හෙයින් ද;

2018 නොවැම්බර් 14 වැනි දින සම්මත වූ යෝජනාවේ පළමුවැනි ඡේදය ඉවත් කර 2018 නොවැම්බර් 16 වැනි දින ගරු මහින්ද රාජපක්ෂ මහතා සහ ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී එම යෝජනාව සම්මත වූ හෙයින් ද;

ඒ අනුව 2018 නොවැම්බර් 14 වැනි දින සම්මත වූ යෝජනාවේ පළමුවැනි ඡේදය ඉවත් කර ඇති හෙයින් ද;

2018 නොවැම්බර් 16 වැනි දින සම්මත වූ යෝජනාව හරයාත්මකව ගරු මහින්ද රාජපක්ෂ මහතා සහ ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් වන හෙයින් ද; සහ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසිරී ඇති හෙයින් ද;

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48(2) ව්‍යවස්ථාව ප්‍රකාරව ගතයුතු ඉදිරි පියවර ගන්නා ලෙස මෙම පාර්ලිමේන්තුව ජනාධිපතිවරයාට යෝජනාකර සිටියි.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***